
පහයි විස්සා
ලාල් හෑගොඩ

# පහයි විස්සා

ලාල් හෑගොඩ

**ඉඳහිට කවියක් දෙකක් ලියවේ.**

**එකතු වී ඇති අතලොස්ස, ග්‍රන්ථයක් වශයෙන්**

**පළ කිරීමට සෑහෙන්නේ නැත.**

**'පහයි විස්සා' යයි නම් කළ කවි ස්වල්පය**

**ඔබ අතට ඉක්මනින් පත් කළ යුතු යැයි සිත කියයි.**

**ඔබ දන්නා කියන කවියට හිතැතියන්ට 'පහයි විස්සා' යැවිය හැකි**

**නම්.....**

**ලාල් හෑගොඩ**
lalhegoda@gmail.com
08-01-2024

පිට කවරය කෘතිම බුද්ධිය ඇසුරෙන් - **සමන්ත පෙරේරා**
අක්ෂර වින්‍යාසය - **හසලා පෙරේරා**

# මල් සුවඳයි ගලන්නේ

පාළු දෙණිවල
උස් කඳු බිමේ
එකලාව සැරිසරන කවියා
හිඳගත්තේය
කඳු කැටියක
වඩන්නට ආනාපාන සති

මල් සුවඳක් එනවා
ඊ සර සේ
විසුනු කරමින් සති

මලක් නැති බිමේ
කොහෙද විලවුන් මංජුසාවක්

හරිත පොරෝණයකින් වසාගත්
ඈත කන්දේ සිට මිස
දුනුදිය අදින්නට
කොහෙද බිමක් මෙහි

ආශ්වාස දිවෙනවා
නාස්පුඩු අතරේ
අතුරුදහන් වෙයි මඟදී
මල් සුවඳයි ගලන්නේ
ඉන්පසු

# පහයි විස්සා

සිත අවදි විය,
නෙතද පිබිදුනි.

නිර්නාමික විහඟා
හැඬුවේ නැත තාමත්
ඌ හඬන්නේ පහයි විස්සට

කොයින්ද ඝටිකාවත් උහුට
හැමදාමත් පහයි විස්සට
නිරුත්තර පැනයකින්
පෙළෙමි සැමදා

දිනක අලුයම පිබිදී,
නොපෙනී යන තෙක් තාරකා
බලාසිටියා

සිතිජයටත් එපිට ලොවක හිඳ
නොඉඳුල් එළිපොදක් පැමිණ
සිප ගත්තා වලා දෙකපොල
රත් පැහැවන තුරු

අන්න විහඟා හැඬුවා
දැන් පහයි විස්සයි

සොයාගත්තා සොයාගත්තා
ප්‍රීතියෙන් ප්‍රීතියෙන් කෑ ගැසුවෙමි.
අසල්වාසීන්ද නිදි ගැට ලෙහෙමින්
අවදි විය
සොයාගත්තා සොයාගත්තා
ඝටිකාව විහඟාගේ

පසුවදා අලුයම
හැමදෙනෙක්ම අවදිවී
ඔරලෝසුත් අතේ බැඳගෙන
අඳුරු අහස් කුස බලා සිටියා
පහයි විස්ස වන තෙක්

වළාකුලක්
රත් පැහැ ගත්තේ නෑ
ඉන්පසු කවදාවත්...

# මව සහ දියණිය

ඇඟිලි අතරින්
ඇඟිලි යවා සුරතේ
අල්ලාගෙන තදින්
දියණියගේ වැඩිමහල්

උස් පිය ගැටයකට
පා තබත්ම
දැඩිවෙයි
ඇඟිලි බැඳුම්

ඉතා තදය ඒ බැඳුම්
නහරවැල් එකිනෙක
බද්ධ වූවා වාගේ

එදා කිරට හරවා
පෙව්වත්
අද ලෙයට ලෙයමයි
මුසුවන්නේ

තිත්ත රස තිබිය හැක
ඇතැයි රහස් කඳුළු දිය
ඇතැයි රැවටිලි බස්
වග වලසුන් දුන්
සිහි වූ අම්මා
අත ඇද ගත්තාය
සැනින්

# රන්කරුවෙකු සොයමි

ඇය එහා ඉවුරේ
සැඟවෙමි
කුඹුක් බඳකට සැනින්

ලපටි සුළියකට හසුවූ
කුඹුක් පත් යැයි සිතුවෙමි

මසුන්ය සැරිසරන්නේ
යටි ගං දියේ
උඩු ගං දියේ සෙමින්

හදවතටත් වඩා
කැලඹුණු මසුන්ය එකවර
රන් රුව සුන් කළේ

දැන් රන් කැබලිය
උස් පහත් වන රැළි අතර

රන්කරුවකු
සොයාගන්නේ කොහින්.

●

පසෙක දණහිස්ය
වැලි කැට විදිනා
පසෙක සිතාර බඳවල් ය
වීණා බඳවල් ය
සිත සංගීතය ගෙනෙනා

" සිත නම් වල් අසෙකි
අල්ලා බැඳ තැබිය යුතු "
මුමුණමින්

වැටුණු සිවුර ද
නැවත රඳවා උරෙ හි
තරුණ හිමි
බෝ මලු වෙන්
ඉවත් විය ඉක්මනින්

# නන්දක්කා..

සෞම්‍ය සොඳුරු
වාණේ ගැහැනිය ගැන
කවියක් බඳින්නට
නැත කවිකම් මා සතු

තැවෙමින්
ඉබාගාතේ ඇවිද යමි.

කඳු මුදුනට වන් කළ
හාත්පස වසා ගත්
ඝන නීල තිරයකි
හැකි උච්ච ස්වරයෙන්
'නන්දක්කා' යයි ගයමි.

ඒ හඬ නැවත පැමිණේ
දෝංකාරයට ලොල් වී
නැවත නැවතත් ගයමි

නිල් අහස යට කර
වලා එකිනෙක මෝදු වෙයි
කැටි ගැසෙයි
අඳුරු වෙයි
අහස සතුටින් හඬයි.

නන්දා මාලනී මහත්මිය පිළිබඳ ලන්ඩන් කවි සඟරාව පළ කළ විශේෂ කලාපයේ ආරාධනයෙන් ලියවුනකි.

# සන්ධිපාද මිතුරා

සයනය මත
උඩුබැල්මෙන් සිටිමි
දැන් තෙමසක්

කෝ මාගේ සන්ධිපාද මිතුරා
දිගුපාද තව දිගු කරමින් යන
නැති මුත් හොරයක්
හොර ගමනක වාගේ යන
මගේ ආදර්ශවත් මිතුරා

ලොව පළමු එඬේරා වගේ
අලක් මුලක් සොයමින්
දඩයමක් හඹා නොයමින්
ගොදුරු දැල වෙත කැඳවා
සෙමින් එකිනෙකා බුදිනා
මා ආදර්ශවත් මිතුරා

අනුභවයත්
මෙවුන්දමත් පමණකින් සෑහී
ජීවිතය සැහැල්ලුවෙන් ගෙවනා
ගෙයක් දොරක් නැති
ජීවිතය වාගේම
සැහැල්ලු සිරුරෙන් සිටිනා

නිවිටන් ගේ කීමට
පිටුපාමින්
පාද පත්ලේ
ක්‍රම විදියක් දරනා
ඔබ කොයිබද
මගේ සන්ධිපාද මිතුරා !